# මායා මැණික සොයාගත් වික්‍රමය




පියුමංසි උමායා මාපාබණ්ඩාර

# මායා මැණික සොයාගත් වික්‍රමය

පියුමංසි උමායා මාපාබණ්ඩාර

**කතෘ**

## කතෘගේ වෙනත් කෘති

- ❖ පැණි පුහුල් ගෙඩිය
- ❖ මගේ පුංචි තුන් ඉරිඅප්පු
- ❖ අපූරු යාලුවෝ
- ❖ උමාගේ කොටි පැටියා
- ❖ බංගලාවේ අභිරහස

මහා/මහාමායා බාලිකා විදුහල
5 ශ්‍රේණිය A
2025/02/08

**IS37218**

# පිදුම

දිවා රෑ වෙහෙසී මගේ අනාගතය වෙනුවෙන් ඇප කැප වන

මගේ ආදරණීය අම්මාට, අප්පච්චීට, සහ මා පුංචි කාලයේ සිට

රැක බලාගත් කිරිඅම්මාට, කිරිඅත්තාට සහ මෙම පොත

ලිවීමට උනන්දු කර වූ අපේ ආදරණීය සමන්මලී ගුරු මෑණියන්ටත්

ප්‍රාථමික අංශයේ පන්තිභාරව සිටි අමිතා ගුරු මෑණියන් ඇතුළු සියලුම මෑණිවරුන්ටත්, පියවරුන්ට

සහ මගේ

පංතියේ සියලු ම මිතුරියන්ට පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේදනිසාය. එසේ නම්මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියත් ගොඩනඟා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමන් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්තදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රටතුල යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් තුල යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන හෙරණගත්කරණි ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ඇති කරන්නට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය

ශෂිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

මායාලන්තයට ඔබව සාදරයෙන් පිළිගන්නවා. ආ.......... අමතක වුනා කියන්න. මෙහෙට මායාලන්තය විතරක් නෙවෙයි මැණික් ලන්තය කියලත් කියනවා. හොඳයි. අද අපේ කතාව පටන් ගන්නේ මෙන්න මෙහෙම. ආ...... සුභ උදෑසනක් ළමයි. "අද මම ඔයාලට කියන්න යන්නේ මීට ගොඩක් කාලෙකට ඉහත අපේ පාසලට අයිති වුණ මැණිකක් ගැන. හොඳින් අහගන්න එහෙනම්". මේ කතා කරේ මායාලන්තේ තියෙන උසස් පාසලේ විදුහල්පතිතුමිය. මේ ළමයි නම් හොඳට අහගෙන ඉන්නවා. ඒත්, ඒත් මොකක්ද අයියෝ ඩෙනිස් නිශ්ශබ්ද වෙලා, අහගන්න දරුවෝ, හරියට උදෑසන රැස්වීමේ ඉන්න පුරුදු වෙන්න කියලා මම කී පාරක් නම් කියලා තියෙනවද? ඒ තමයි ඩෙනිස්ලගේ පන්තිභාර ගුරුතුමිය. මිස් ඩේලියා. ඒක මලක නමක්. ඔව්. ඇත්තටම මලක නමක්. කොහොම හරි උදෑසන රැස්වීම නම් ඉවරයි. හොඳයි ළමයි.



අද අපේ පාඩම පටන් ගමු. ටොක්ටොක්ටොක් සමාවෙන්න මම ඇතුලට එන්නද ඇරලා තිබුන දොර ළඟ විනීත විදිහට ගැහැනු ළමයෙක් කතා කළා. ආ ඔව් පුතේ ඇතුලට එන්න ළමයි මේ ඔයාලගේ අලුත් යාළුවා. ඉතින් ඔයාගේ නම කියන්න පන් කියන්න පන්තියට මිස් ඩෙලියා අලුත් නමුත් ඒවා සාදරයෙන් පිළිගත්තා.

මගේ නම මායා. ඔව් ඒ මායා පාසලට අලුතින් ආව ශිෂ්‍යාව හරි අපූරු නමක් දරුවෝ. හොඳයි. අන්න අතනින් වාඩිවෙන්න ඉතින් ගුරුතුමිය කියූ ස්ථානයේ මායා වාඩිවුණා. මුලින්ම නාම ලේඛනය ලකුණු කරමු.. හොඳයි ළමයි. අද අපේ පාඩම පටන් ගමු. ටොක්.......ටොක්.......ටොක්........

" සමාවෙන්න මම ඇතුළට එන්න ද?" ඇරලා තිබුණ දොර ළඟ විනීත විදිහට ගැහැණු ළමයෙක් කතා කළා. "ආ...... ඔව් පුතේ ඇතුළට එන්න..... ළමයි මේ ඔයාලගේ අළුත් යාළුවා. ඉතින් ඔයාගේ නම කියන්න පන්තියට." මිස් ඩේලියා අළුත් අමුත්තියව ඒවා සාදරයෙන් පිළිගත්තා. "මගේ නම මායා". ඔව් ඒ මායා පාසලට අළුතින් ආව ශිෂ්‍යාව. හරි අපූරු නමක් දරුවෙ හොඳයි. අන්න අතනින් වාඩිවෙන්න ඉතින් ගුරුතුමිය කියූ ස්ථානයේ මායා වාඩිවුණා. මුලින්ම නාම ලේඛනය ලකුණු කරමු.."රෝස් ඉන්නවා" " ලිලී?" ඉන්නවා මිස්. " රොකී?" කිසි සද්දයක් නැහැ. "රොකී ඉන්නවද?" " ඉන්නවෝ " ඇත්තටම රොකී ඒ ඉන්නවා කිව්වේ දොර ළඟ ඉඳන්. ඒ කියන්නේ රොකී පරක්කුයි කියලා. "අනේ රොකී අදත් පරක්කුයි.

ඇයි දරුවෝ හැමදාම මෙහෙම පරක්කු වෙන්නේ ? හරි පන්තියට ගිහින් වාඩි වෙන්න." නාමලේඛනය ලකුණු කරාට පස්සේ ගුරුතුමිය පාඩම පටන් ගත්තා ගත්තා. අද අපි ඉගෙන ගන්නේ විශේෂ මැණික් සොයාගන්න මායාවක්. ගුරුතුමිය පාඩම කරගෙන ගියා. ළමයිත් මේ පාඩම ගොඩක් වුවමනාවෙන් අහගෙන හිටියා. හැබැයි එක් කෙනෙක් ඇර. "ඩෙනිස් පාඩම අහගන්න වෙන වැඩ නවත්තලා." ඇත්තටම ඩෙනිස් කියන්නේ හිත එක තැනක තියාගන්න බැරි කෙනෙක්. හැබැයි එහෙම කියලා කවදාවත් ලකුණු අඩු වෙන්නේ නැහැ. දවසින් දවස ලකුණු වැඩි වෙනවා මිස. අද දවසේ ඉගෙන ගත්ත ගොඩක් දේවල් ඉස්කෝලේ ළමයින්ට ගොඩක් අළුත්. මොකද මේ වෙනකම් ඒ ගොල්ලෝ ඉගෙන ගත්තේ මැලවෙච්ච මල් පැල පණ ගන්වන විදිහ සතුන් එක්ක. කතා කරන මායාවන්. වගේ පුංචි පුංචි දේවල්. ඉතින් අද පාඩම ගොඩක් වෙනස්පාඩමක්. මායා පාසල ඇරුණට පස්සේ කැලෑවට ගියා. මොකද මායාගේ සීයා කැලෑවේ ලොකු ව්‍යාපෘතියක් කරනවා. මායා සීයා ඉන්න තැනට දුවන් ගියා.

"මායා කොහොමද අද අලුත් ඉස්කෝලේ අපූරුයිද?" සීයා ඇසුවේ මායා ගොඩක් සතුටින් සිටි නිසයි. "ඔව් සීයා ගොඩක් අපූරුයි. මට අලුත් යාළුවොත් හම්බ වුණා. එක්කෙනෙක් රෝස්. එයා කිව්වා එයා ගොඩක් ආස ගවුම් අඳින්න කියලා. තව ඩෙනිස් එයා නම් හිත එක තැනක තියාගන්නම බැරි කෙනෙක්." රෝස් කිව්වා හැබැයි එයාගෙන් පාඩමට අදාළ ප්‍රශ්නයක් ඇහුවොත් උත්තර දෙනවා. අනිත් එක්කෙනා රොකී රෝස් කිව්වා, රොකී හැමදාම ඉස්කෝලේ එන්නේ නාම ලේඛනය ලකුණු කරන වෙලාවටලු. මේ තුන්දෙනා ගොඩක් දක්ෂයි. නිහතමානියි.



මායා පාසල ඇරුණට පස්සේ කැලෑවට ගියා. මොකද මායාගේ සීයා කැලෑවේ ලොකු ව්‍යාපෘතියක් කරනවා. මායා සීයා ඉන්න තැනට දුවන් ගියා. "මායා කොහොමද අද අලුත් ඉස්කෝලේ අපූරුයිද?" සීයා ඇසුවේ මායා ගොඩක් සතුටින් සිටි නිසයි. "ඔව් සීයා ගොඩක් අපූරුයි. මට අලුත් යාළුවොත් හම්බ වුණා. එක්කෙනෙක් රෝස්. එයා කිව්වා එයා ගොඩක් ආස ගවුම් අඳින්න කියලා. තව ඩෙනිස් එයා නම් හිත එක තැනක තියාගන්නම බැරි කෙනෙක්." රෝස් කිව්වා හැබැයි එයාගෙන් පාඩමට අදාළ ප්‍රශ්නයක් ඇහුවොත් උත්තර දෙනවා. අනිත් එක්කෙනා රොකී රෝස් කිව්වා, රොකී හැමදාම ඉස්කෝලේ එන්නේ නාම ලේඛනය ලකුණු කරන වෙලාවටලු. මේ තුන්දෙනා ගොඩක් දක්ෂයි. නිහතමානියි. ඒ වගේම මිත්‍රශීලී. " මායා එයාට අලුත් යාලුවෝ ලොකු කතාවක් කිව්වා. හොඳයි "ආ........යාළුවොත් අපූරුයි. ඔයාට ගැලපෙනවා වගේ" සීයා මායාගේ ඔලුව අතගාන ගමන් එහෙම කිව්වා. මායා මදහසක් පෑවා. කොහොම හරි එදා දවස නම් ඔහොම ගෙවිලා ගියා.

ඊළඟ දවසේ මායා වෙනදට වඩා උදෙන් නැගිටලා පහළට ඇවිත්. "මම යනවා අම්මා " කියාගෙන ගෙදරින් එළියට යන්න තමයි ගියේ. "හැබැයි මායා මේ කිරි එක බීලායන්න." ආපහු හැරුණු මායා කිරි එකත් බීලා පාන් පෙත්තකුත් කකාම එළියට ගියා. "සුභ උදෑසනක් මායා." එක්කෙනෙක් නෙවෙයි. තුන්දෙනෙක්ම මායා පස්සේ හති දමමින් දුවගෙන එන ගමන් කිව්වා. "ආ.... සුභ උදෑසනක්. ඔයා කොහෙද ඉන්නේ? ඒත් අපි මීට කලින් ඔයාව දැකලා නැහැනේ. වෙනදට පරක්කු වෙලාද ඉස්කෝලේ යන්නේ?" ඒ ඇහුවේ රෝස්. "අපි මේ ළඟදි තමයි මෙහෙට ආවේ." හතර දෙනාම කතා කර කර ඉස්කෝලෙට ගියා. විවේක කාලයේදී යාළුවෝ හතර දෙනා කතා වුනේ උදෑසන රැස්වීමේදී විදුහල්පති තුමිය කියූ අතීත කතාව ගැන. "මට හිතෙන්නේ ඔය මායා මැණික ඇත්තේ අපේ ඉස්කෝලේ ඇතුලෙම කොහේ හරි." ඒ කිව්වේ රොකී. දන්නෙම නැතිව විවේක කාලය ඉවර වුණ නිසා ළමයි පන්ති වලට ගියා. පන්ති භාර ගුරුතුමිය ඩේලියා තවත් පාඩමකට ලෑස්ති වෙනවා කියලා පේන්න තිබුණේ නැහැ. නැහැ.

පන්තියේ ළමයි ඔක්කොම ආවද කියලා සොයා බලපු මිසිස් ඩේලියා කතා කරන්න පටන් ගත්තා. "ළමයි මේ අහන්නකෝ, ඔයාලා දන්නවද ප්‍රින්සිපල් මැඩම් අපේ ඉස්කෝලේ අතීත කතාව කිව්වේ කියලා. " "ඇත්තටම එයාට ඕන ආපහු ඒ මැණික අපි හොයාගන්න. අපි බලාපොරොත්තු වෙනවා අපේ පාසලේ කවුරු හෝ ඒ මැණික සොයා ගයි කියලා .මොකද වැඩිහිටියන්ට වඩා ඔයාලා මේක කරන එක ගොඩක් හොඳයි . ඔයාලගේ ජීවිත වලට අත්දැකීම් ගන්න පුළුවන්. ඉස්කෝලේ දියුණුවට වුනත් මේ මැණික නැතුව අමාරුයි. තව ටික කාලයක් යනකොට අපේ පාසල වහන්න වුනත් බැරි නැහැ. ඒ නිසා ඔයාලා පුළුවන් තරම් උත්සාහ කරන්න මේ මැණික සොයාගන්න අපට උදව් කරන්න. අපේ පාසලේ අනාගතේ තියෙන්නේ ඔයාලගේ අතේ." " හරි දැන් පාසල ඇරෙන්නත් ළඟයි. දැන් ඔයාලා ගෙවල් වලට යන්න සූදානම් වෙන්න. අපි ඔයාලා ගැන ලොකු බලාපොරොත්තුවක් තියාගෙන ඉන්නේ." ගුරුතුමිය එයාගේ කතාව නම් ඉවර කළා. ළමයින්ට ගුරුතුමිය එක පාරටම මේ කිව්ව දේවල් තේරුම් ගන්න අපහසු වුණා.

හිතේ කුතුහලයක් තියාන ළමයි ගෙවල් වලට ගියා. ඒත් රෝස් ,මායා, සහ ඩෙනිස් පන්තියේ ටික වේලාවක් කතා කරමින් සිටියා. ඔය වෙලාවෙ මේ හතර දෙනාව දැක්ක ගුරුතුමිය, තාමත් ගෙදර ගියේ නැත්තේ ඇයි කියලා ඇසුවා. හතර දෙනා කිව්වේ දැන්ම ගෙදර යන්න බැහැ කියලා. ගුරුතුමිය ඔළුව වනලා පොත් රාක්කය අස් කරන්න පටන් ගත්තා .ටික වේලාවකට පසු ගුරුතුමිය "අනේ දරුවනේ මට උදව්වක් කරන්න පුළුවන්ද? මෙන්න මේ පොත් ටික බේස්මන්ට් එකට දාන්න. ඉතින් හතර දෙනාම කිසිම පැකිලීමකින් තොරව ඒකට එකඟ වුණා. යහළුවන් හතර දෙනා පොත් ටිකත් රැගෙන බේස්මන්ට් එකට ගියා. රෝස් තමයි ඉදිරියෙන්ම ගියේ.

රෝස් බේස්මන්ට් එකේ අන්තිම පඩිය බහිනවාත් සමගම කකුල පැටලී උමං දොරක් ඇරගෙන පහළට ඇද වැටුනා.



"ආහ්...."රෝස්ට කෑ ගැසුණා. නමුත් ඇයට කිසිදු තුවාලයක් නැත. "රෝස් මොකද උනේ? ඔයා හොඳින් නේද?" යහළුවන් තිදෙනා ඇසුවා. "ඔව් මම හොඳින්. කිසි ප්‍රශ්නයක් නැහැ. "ඔයාලත් පහළට එන්න. මට මොකක් හරි දෙයක් දැනෙනවා." රෝස්ගෙ පිළිතුර උනේ ඒකයි. ඉහළ සිටි යහළුවන් තිදෙනාද පහලට ගියා. එම ස්ථානයේ ඉතා අපූරුයි. උමං මාර්ගය ඉදිරියට කිසිදු අපහසුතාවයකින් තොරව යාමට ඉටිපන්දම් පත්තු කර තිබුණා. මිතුරන් සිව් දෙනා උමග ඇතුලට කිසිදු බියකින් තොරව ගමන් කළා. ටික වේලාවකට පසු දෙපසට විහිදුනු මාර්ගයක් හමුවුණා. ගැහැණු ළමයි දෙදෙනා එක් මාර්ගයකත් පිරිමි ළමුන් දෙදෙනා අනෙක් මාර්ගයේත් ගමන් කළා.

ටික දුරක් ගියාට පසුව ගැහැණු ළමයින් දෙන්නා දෙදෙනාට භයානක නාගයෙක් හමුවුණා. . "ආයුබෝවන් නයි හාමි ඔබට පුළුවන්ද අපට උදව් කරන්න?" රෝස් බොහෝ කරුණාවෙන් නයාගෙන් විමසුවා. නයා පුදුම උණා. මොකද කවදාවත් නයාට කවුරුත් කරුණාවෙන් කතා කරලා නැහැ.ආයුබෝවන්! ඔයාලා ගොඩක් කරුණාවන්ත ළමයි දෙදෙනෙක්. මම ඔයාලට අනිවාර්යයෙන්ම උදව් කරනවා. හැබැයි මට ඔයාලට මග පෙන්වන්න පුළුවන් ඉදිකටු කැලෑවට යනකම් විතරයි. නයා එහෙම කියලා ගෑනු ළමයි දෙදෙනාට පාර පෙන්නුවා. ඔය අතරතුර පිරිමි ළමයි දෙදෙනාට කපටි නරියෙක් හමුවුණා. මේ නරියා පිරිමි ළමයි දෙදෙනාට කැමැත්තෙන්ම උදව් කළා. තුන්දෙනා මෙහෙම යන අතරේ නරියා එක එක ප්‍රශ්න ඇසුවා. හැබැයි ළමයි දෙන්නා හොඳට කල්පනා කරලා කපටි නරියාට පිළිතුරු දුන්නා. අන්තිමේදී මේ තුන්දෙනා නතර උනේ ලණුවක් ළඟ. ඔයාලා මේ ලණුව දිගේ එහා පැත්තට යන්න ඕන. අවසානයේ නරියා සමු අරන් ගියා.

ළමයි දෙන්නා ආත්ම විශ්වාසය ඇති කරගෙන ළඟුව දිගේ ගියා. මායා, රෝස් දෙන්නත් ඉදිකටුවල වේදනාව දරාගෙන කැලෑවෙන් එළියට ආවා. අවසාන හතර දෙනාම ලස්සනට දිලිසෙන මැණිකක් ළඟ නතර වුණා. මැණික වටේ සුරංගනාවියෝ හතර දෙනෙක් සිටියා. එක සුරංගනාවියක් කතා කළා. මම තමයි ඉරට අධිපති. මේ සඳට අධිපති. එතකොට මේ දෙන්නා ගින්දරට සහ ජලයට අධිපතියෝ. අපි ඔයාල දිහා බලාගෙනමයි හිටියේ. ඔයාලා ළඟ කරුණාව, බුද්ධිමත් කම, ආත්ම විශ්වාසය සහ දර ගැනීම තියෙනවා. ඔයාලා තමයි මේ මැණිකේ උරුමක්කාරයෝ. එහෙම කියලා හිරු සුරඟන මැණික ළමයින්ට දෙනවාත් සමගම එයාලා පන්ති කාමරයෙන් මතු වුණා. ගුරුතුමිය පිටුපස හැරී බලන විට ළමයි අතේ මැණික තියෙනවා දැකලා, විදුහල්පතිනියට දැනුම් දුන්නා. ඊළඟ දවසේ උදෑසන රැස්වීමේදී මැණික සොයාගත් වීරයෝ හතර දෙනා ගැන අනික් ළමයින්ටත් පැවසුවා.

මැණික සොයාගන්න ඕන වුණ කරුණාව, බුද්ධිමත්කම, දරා ගැනීම සහ ආත්ම විශ්වාසය අනිත් ළමයි ළඟත් තියෙන්න ඕනේ කියලා විදුහල්පතිතුමිය කිව්වා. අවසානයේ පාසලේ ගොඩාක් කාලයක් අපූරු සාධක හතරත් එක්ක පැවතුණා.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මකක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍යය කෙතේ ලේඛක රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන්වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ.

සම්බන්ධීකාරක.

සෙනවිරත්න මහලේකම්.

**IS37218**